# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීම - 2022

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන උප දුම්රිය ස්ථානාධිපති තනතුරු සඳහා පුරප්පාඩුව පවතින පහත සඳහන් උප දුම්රිය ස්ථානයන් වෙත මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

i. මදුරන්කුලිය
ii. කීනවල
iii. මග්ගොන
iv. කටුකුරුන්ද
v. දුම්රිය නැවතුම අංක 1
vi. උඩතලවින්න
vii. කුඩහකපොල

01. *උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ රාජකාරි විස්තර* :

ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථාන භාරව සේවයේ යොදවනු ලබන නියෝජිතවරුන් ඒ ඒ ස්ථානයේ නවත්වනු ලබන දුම්රිය අනුව පැය 24 පුරාම ප්‍රවේශපත්‍ර අලෙවි කිරීම, පාර්සල් භාර ගැනීම හා ලැබෙන පාර්සල් අයිතිකරුවන්ට භාරදීම, දවසේ එකතුවන මුදල් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරිවරයාට ප්‍රේෂණය කිරීම, එම ස්ථානය පිරිසිදුව තබා ගැනීම හා දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන වෙනත් රාජකාරි ද මෙම නියෝජිතවරුන්ගේ සාමාන්‍ය රාජකාරී වේ.

02. *දීමනා* :

ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් නොවන තනතුරකි. තෝරා ගනු ලබන අයවළුන්ට ඒ ඒ ආදායම් පදනම් කරගත් කොමිස් මුදල් හා අනුමත දීමනා පමණක් ගෙවනු ලැබේ. තවද අවම කොමිස් මුදල රු. 310 ක් වන අතර (ආදායම අනුව කොමිස් මුදල ගණනය කළ විට ලැබෙන මුළු කොමිස් මුදල රු. 10,000 ට අඩුවන අවස්ථාවලදී රු. 10,000 ක කොමිස් මුදලක් හිමි වේ.) කොමිස් මුදලට අමතරව, රු. 5,329 ක දීමනාවක් හිමි වේ.

03. අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණක් වේ. එක් අයදුම්කරුවෙකු හට තම දුර සීමාවෙහි පවතින පුරප්පාඩු උප දුම්රිය ස්ථාන තුනක් සඳහා මනාපය අනුව අයදුම් කිරීමේ හැකියාව පවතින අතර විභාගයේදී උප දුම්රිය ස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් සඳහා වැඩි ලකුණු ලබා ගත්තේනම් අයදුම්පතෙහි සඳහන් කරන ලද මනාපයේ අනුපිළිවෙල අනුව උප දුම්රිය ස්ථාන සඳහා පත් කිරීම සළකා බැලීම සිදු කරනු ලැබේ. යම් උප දුම්රිය ස්ථානයක් සඳහා තේරී පත්වූ පසු මනාපය පළ කරන ලද අනෙකුත් උප දුම්රිය ස්ථාන පුරප්පාඩු වුවද නැවත එම උප දුම්රිය ස්ථාන ඉල්ලුම් කිරීමට කිසිදු අයිතිවාසිකමක් නොමැති අතර එම උප දුම්රිය ස්ථාන සඳහා වන මනාපයන්ද අවලංගු කරනු ලැබේ.

04. *වයස් සීමාව*.- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් 06 කින් එකවර සමත් විය යුතුය.

06. *වෙනත් සුදුසුකම්* :

(i) ඉල්ලුම්කරු අදාළ උප දුම්රිය ස්ථානයේ සිට කිලෝමීටර් 20 ක් ඇතුළත (ඍජු දුර) ආසන්න දුර සීමාවේ වසර 05ක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. අනුයුක්ත කිරීමේ ලිපිය ප්‍රදානය කිරීමට පෙර මේ බව පිළිගත හැකි ලිපිවලින් සනාථ කළ යුතුය. (ග්‍රාම නිලධාරි සහතිකය, ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය, ඡන්ද නාම ලේඛනයේ පිටපතක් ආදී වශයෙන්) අයදුම්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය ස්ථිර ලිපිනය විය යුතු අතර දුම්රිය ස්ථානයට ඇති ඍජු දුර ගණනය කළ යුත්තේ එම ස්ථානයේ සිටය.

(ii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(iii) උස 5' 4''කට හා පපුව 32'' කට නොඅඩු වීම.

(iv) උප දුම්රිය ස්ථානාධිපතිවරයෙකු වශයෙන් දැනට සේවය කරනු ලබන හෝ එසේ සේවය කර සේවය අවසන් කරන ලද අයවළුන්හට මේ සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නැත.

(v) තෝරාගනු ලබන්නේ යහපත් ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් හා අක්ෂි දෘෂ්ඨිය යහපත් තත්ත්වයේ ඇති බවට තහවුරු කරගැනීමෙන් පසුව වේ. ඉහත සුදුසුකම් හා හොඳ ඇස් පෙනීමක් ඇති අයෙකුවීම අනිවාර්යය වේ.

පත්කිරීමට සළකා බැලීම පිණිස සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ii. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමක් සිදු නොවේ.

iii. සුදුසුකම් ලැබූවන් සම ලකුණු ලබා සිටියහොත් එවැනි අවස්ථාවලදී දුම්රිය ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිතවරයා යටතේ හෝ උප දුම්රිය ස්ථානාධිපතිවරයා යටතේ අනුමත ආදේශකයෙකු වශයෙන් සේවය කර ඇති අයදුම්කරුවාට අවස්ථාව දෙනු ලැබේ. එසේ නොවන්නේ නම් අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානයේ සිට වඩාත්ම ආසන්න පදිංචිකරුවා තෝරාගනු ලැබේ.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තෝරාගනු ලබන අය විසින් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන පරිදි හෝ අවම වශයෙන් රු. 25,000 ක මුදලක් ආරක්ෂක ඇපයක් වශයෙන් දුම්රිය සාමාන්‍යධිකාරීවරයාගේ නමට තැන්පත් කළ යුතු අතර, දුම්රිය සාමාන්‍යාධිකාරී වරයා සමඟ අත්සන් කරනු ලබන ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. එම ගිවිසුමේ කොන්දේසි කඩකිරීම සේවය අවසන් කිරීමට හේතුවක් වනු ඇත.

(ii) මෙය කොන්ත්‍රාත් පදනමක් වන අතර, අවුරුද්දක් පාසා අදාළ ගිවිසුම අලුත් කළ යුතු ය. එසේ අලුත් නොකරනු ලබන අවස්ථාවේදී ගිවිසුම අහෝසි වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු තමා අනුයුක්ත කරනු ලබන ස්ථානයේ රාජකාරි පිළිබඳව දින 14 ක පුහුණුවක් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නියම කරනු ලබන දුම්රිය ස්ථානයකින් ලබාගත යුතු වේ. මෙම පුහුණු කාලය

07. *තෝරා ගැනීමේ ක්‍රමය :*

දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ කුසලතාවය මත තෝරාගනු ලැබේ. ඒ අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී සියලුම අයදුම්කරුවන් පහත දැක්වන විෂයයන් යටතේ ප්‍රශ්න පත්‍ර 02 කට පිළිතුරු සැපයිය යුතු වේ. විභාගයෙන් සුදුසුකම් ලැබීම සඳහා එක් විෂයයකින් අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබාගත යුතු වේ.

(i) *භාෂා හැකියාව :*
කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි.
අවබෝධය හා නිවැරදි බස හැසිරවීම පිළිබඳ විෂයානුබද්ධ ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි.

(ii) *බුද්ධි පරීක්ෂණය :*
කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි.
ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ගණිත ගැටළු, භාෂා ඛණ්ඩ, වගු ගැලපීම් සටහන් පින්තූර, ප්‍රස්ථාර ඇසුරෙන් තර්කානුකූල ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව සහිත විචාර බුද්ධිය මැන බැලීමේ බහුවරණ ක්‍රමයේ ප්‍රශ්න පත්‍රයකි.

සටහන :-

i. තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය අතරින් ඒ ඒ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය අනුව, වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරු අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය සඳහා

(ii) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලටද යටත් වීමට එකඟවිය යුතු ය.

10. *විභාග ගාස්තු :*

සියලුම අයදුම්කරුවන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් දුම්රිය සාමාන්‍යාධිකාරී නමට මහජන බැංකුවේ ගිණුම් අංක 176100129027313 දරන ගිණුමට බැරකර ලබාගන්නා ලද රිසිට්පත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. වෙනත් ක්‍රම වලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. අසම්පූර්ණ හෝ අවිධිමත් අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය විභාග මධ්‍යස්ථානයේදී තහවුරු කළ යුතු ය.

11. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*
යතුරු ලියන කඩදාසි ප්‍රමාණයේ (A -4) අයදුම්කරුවා විසින්ම අයදුම්පත සකස්කරගත යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙලවරේ ''උප දුම්රිය ස්ථානාධිපති විභාග අයදුම්පත්‍රය - 2022'' යනුවෙන් සඳහන් කර දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10 යන ලිපිනයට **2022.10.10** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රය පහත පරිදි වේ.)

සඳහා කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iv) තමා වෙනුවට සහායට වැඩ කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව තමන්ට සහායකයෙකු අනුමත කරවාගත හැකි වන අතර ආදේශකවරයා වෙනුවෙන් කිසිදු දීමනාවක් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු නොලැබේ. උප දුම්රිය ස්ථානයේ සම්පූර්ණ වගකීම උප දුම්රිය ස්ථානාධිපතිවරයා සතුය.

(v) පුහුණුව ලබන කාලය තුළ හෝ උප දුම්රිය සථානාධිපති වශයෙන් කටයුතු කරමින් සිටින කිසියම් අවස්ථාවකදී හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවකදී හෝ අපේක්ෂකයා විසින්/ඔහු වෙනුවෙන් ලබා දී ඇති/සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම් දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ සේවය ලබාගැනීම අවසන් කරනු ලැබේ.

(vi) උප දුම්රිය ස්ථානාධිපති ලෙස තෝරා ගන්නා අයෙකුට එම තේරීම මත දුම්රිය දෙපාර්තමේන්තුවේ කිසිදු ස්ථිර තනතුරක් ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නොමැත.

09. *සේවා කොන්දේසි :*

(i) අත්සන් කරනු ලබන ගිවිසුමේ යම් කොන්දේසියක් හෝ කීපයක් හෝ කඩකළහොත් ඔහුගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබේ.

12. *අයදුම්පත සහතික කිරීම :*

ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුවාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥවරයෙකු/ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

13. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතු ය.

ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2022 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ය.